සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සහන්, අමරදූව නගරයේ ගොඩනැගිල්ලක් කුලියට ගෙන 'යාත්‍රා' නමින් දුරකථන සේවා සපයන ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඒ අසල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අමරදූව මහා විද්‍යාලය හා අමරදූව විවිධ සේවා සමුපකාර සමිතිය පිහිටා ඇත.

**1.** යාත්‍රා ව්‍යාපාරය සපුරාලන මිනිස් අවශ්‍යතාව කුමක් ද?
(1) ප්‍රවාහනය
(2) දුරකථන සේවාව
(3) විනෝදාස්වාදය
(4) සන්නිවේදනය

**2.** ලාභ අරමුණුකර නොගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානය වන්නේ
(1) යාත්‍රා ව්‍යාපාරයයි.
(2) අමරදූව මහා විද්‍යාලයයි.
(3) අමරදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයි.
(4) අමරදූව විවිධ සේවා සමුපකාර සමිතියයි.

**3.** සහන්ගේ යාත්‍රා ව්‍යාපාරය අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසියක් වන්නේ
(1) සහන්ගේ වගකීම අසීමිත වීම ය.
(2) සහන්ගේ මූල්‍ය ශක්තිය සීමා වීම ය.
(3) සහන්ට ස්වාධීනව තීරණ ගත හැකි වීම ය.
(4) සහන්ගේ ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම ය.

**4.** අමරදූව මහා විද්‍යාලය, සහන්ගේ යාත්‍රා ව්‍යාපාරයට
(1) ශක්තියකි.
(2) දුර්වලතාවකි.
(3) අවස්ථාවකි.
(4) තර්ජනයකි.

**5.** ඉහත සිද්ධියට අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සහන්, යාත්‍රා ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසර සාධකයකි.
(2) යාත්‍රා ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් ඇත.
(3) අමරදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ලාභ අරමුණු කරගත් සංවිධානයකි.
(4) යාත්‍රා ව්‍යාපාරය පවත්වාගෙන යන ගොඩනැගිල්ල එම ව්‍යාපාරයේ නිෂ්පාදන සාධකයක් වන ප්‍රාග්ධනයට අයත් වේ.

6. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත තේ මැද පෙරදිග රටවලට විකිණීම ① ........................ වෙළෙඳාම් වන අතර, මැද පෙරදිග රටවලින් ඛනිජ තෙල් මිලට ගැනීම ② ........................ වෙළෙඳාම වේ.
මෙම ප්‍රකාශයේ ① හා ② ස්ථාන සඳහා නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ආනයන, අපනයන
(2) අපනයන, ආනයන
(3) අපනයන, විදේශීය
(4) විදේශීය, අපනයන

7. අනෙකුත් බැංකුවලට වඩා බලපත්‍රලාභී වාණිජ බැංකුවල සුවිශේෂී ලක්ෂණයක් වන්නේ
(1) ජංගම ගිණුම් පවත්වාගෙන යාමයි.
(2) ඉතිරිකිරීමේ ගිණුම් පවත්වාගෙන යාමයි.
(3) ස්ථාවර තැන්පතු පවත්වාගෙන යාමයි.
(4) තැන්පතු මත ණය ලබා දීමයි.

8. වාණිජ බැංකු නිකුත් කරන චෙක්පත්වල චුම්භක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ (M.I.C.R.) මුලින්ම සඳහන් වන්නේ කුමක් ද?
(1) චෙක්පත් අංකය
(2) බැංකුවේ අංකය
(3) බැංකු ගිණුම් අංකය
(4) බැංකු ශාඛා අංකය

9. පුවත්පතක පළවූ සිරස්තලයක් පහත දැක්වේ.
"අධිවේගී මාර්ගයේ ගමන් ගත් බස් රථයක් ගිනි ගනියි."
මෙම පුවත්පත් සිරස්තලයේ ඇතුළත් ප්‍රවාහන මූලිකාංග නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) මාර්ගය හා බස් රථය
(2) මාර්ගය හා පර්යන්තය
(3) මාර්ගය හා මාධ්‍යය
(4) මාධ්‍යය හා බස් රථය

10. රයන් තම බිරිඳ සඳුනි සමග ඔහුගේ සේවා ස්ථානයට යන්නේ තමාගේ මෝටර් රථයෙනි. මෙම මෝටර් රථය සීමිත සුහද රක්ෂණ සමාගමේ රක්ෂණය කර ඇත.
මෙම සිද්ධියේ ඇතුළත් රක්ෂණයට සම්බන්ධ දෙවන හා තෙවන පාර්ශ්ව පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) රයන් හා සඳුනි
(2) රයන් හා සීමිත සුහද රක්ෂණ සමාගම
(3) සීමිත සුහද රක්ෂණ සමාගම හා මෝටර් රථය
(4) සීමිත සුහද රක්ෂණ සමාගම හා සඳුනි

- පහත තොරතුරු භාවිත කර, අංක **11, 12** හා **13** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**(1) නව මාදිලියේ ජංගම දුරකථන** විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන නදීමාල්, අලෙවිය වැඩිකර ගැනීම සඳහා **(2) අත් පත්‍රිකාවක් (3) "මිල අඩුකිරීමක් ! වෙළෙඳසැලට පැමිණෙන්න"** යන වගන්තිය සහිතව මුද්‍රණය කර බෙදාහැරීමට තීරණය කරන ලදී.

11. ඉහත සිද්ධියේ (1), (2) හා (3) යන තද කළු අකුරින් මුද්‍රිත වචනවලින් දැක්වෙන අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් පිළිවෙළින්
(1) ප්‍රවර්ධනය, මිල හා ප්‍රවර්ධනය ය.
(2) නිෂ්පාදිතය, මිල හා ස්ථානය ය.
(3) නිෂ්පාදිතය, ප්‍රවර්ධනය හා මිල ය.
(4) ස්ථානය, ප්‍රවර්ධනය හා මිල ය.

12. ඉහත සිද්ධියේ ඇතුළත් කළමනාකරණ කාර්යය වන්නේ
(1) සැලසුම්කරණයයි.
(2) සංවිධානකරණයයි.
(3) මෙහෙයවීමයි.
(4) පාලනයයි.

13. නදීමාල්ගේ ව්‍යාපාරයේ අභ්‍යන්තර හා බාහිර පරිසර සාධකය බැගින් පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) නදීමාල් හා ජංගම දුරකථන
(2) ව්‍යාපාරය හා නදීමාල්
(3) නදීමාල් හා වෙළෙඳසැලට පැමිණෙන්නන්
(4) මිල හා වෙළෙඳසැලට පැමිණෙන්නන්

14. තොග වෙළෙඳාම පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) තොග වෙළෙඳාමේදී භාණ්ඩ කිහිපයක් පමණක් විකිණීම කළ නොහැකි ය.
(2) තොග වෙළෙන්දා, සිල්ලර වෙළෙන්දා සමග සෘජු සම්බන්ධතාවක් පවත්වා ගනියි.
(3) තොග වෙළෙන්දා අවසාන පාරිභෝජනය සඳහා භාණ්ඩ හෝ සේවා විකිණීම සිදු කරයි.
(4) තොග වෙළෙඳසැල් තිබිය යුතු වන්නේ පාරිභෝගිකයාට ඉතාම ආසන්න ස්ථානයක ය.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**15.** කළමනාකරණ කාර්ය දෙකක් පහත දැක්වේ.

**A** - ව්‍යාපාරයේ නිෂ්පාදිතවල ගුණත්වය වැඩි කිරීමට සේවකයින්ට උපදෙස් ලබා දීම

**B** - සේවකයින්ට කාර්යක්ෂමව වැඩ කිරීමට අවශ්‍ය හිතකාමී පරිසරයක් සකස්කර දීමට තීරණය කිරීම

ඉහත කාර්ය දෙක පිළිවෙළින් අයත් වන්නේ,

(1) සැලසුම්කරණයට හා මෙහෙයවීමට ය.
(2) මෙහෙයවීමට හා සැලසුම්කරණයට ය.
(3) මෙහෙයවීමට හා සංවිධානකරණයට ය.
(4) පාලනයට හා සැලසුම්කරණයට ය.

**16.** බොහෝ පුද්ගලයෝ තම මුදල් ඉතිරි කිරීමේ ගිණුම්වල තැන්පත් කිරීමට වැඩි කැමැත්තක් දක්වති. මෙයට වඩාත්ම බලපාන හේතුව වන්නේ

(1) රජයේ පූර්ණ ආරක්ෂාවක් ලැබීමයි.
(2) ඉහළ පොලී ආදායමක් ලැබීමයි.
(3) අනෙකුත් ආයෝජන මාර්ගවලට වඩා වැඩි ප්‍රතිලාභ හිමිවීමයි.
(4) අවශ්‍ය ඕනෑම වේලාවක ඉක්මනින්ම මුදල් ආපසු ලබාගත හැකිවීමයි.

**17.** 'ගිණුම්කරණය' යනු

(1) ව්‍යාපාරයක සිදුවන මූල්‍යමය ගනුදෙනු පොත්වල සටහන් කිරීමයි.
(2) ව්‍යාපාරයක ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා අවශ්‍ය ගනුදෙනු වාර්තා කිරීමයි.
(3) ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශ්වයන්ට අවශ්‍ය තීරණ ගැනීම සඳහා විවිධ තොරතුරු සැපයීමයි.
(4) ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශ්වයන්ට අවශ්‍ය තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීමේ ක්‍රියාවලියයි.

**18.** ව්‍යාපාරයක ජංගම නොවන වගකීමක් වන්නේ

(1) ප්‍රාග්ධනය ය.
(2) ණයහිමියෝ ය.
(3) බැංකු ණය ය.
(4) ගෙවිය යුතු විදුලි ගාස්තු ය.

**19.** වැඩිවීම බැර අඩුවීම හර යන ද්විත්ව සටහන් මූලධර්මය අදාළ වන ගිණුමක් වන්නේ

(1) ලද වට්ටම් ගිණුම ය.
(2) ගැනිලි ගිණුම ය.
(3) බැංකු ණය පොලී ගිණුම ය.
(4) ගොඩනැගිලි ගිණුම ය.

**20.** සමීරගේ ව්‍යාපාරය රු. 25 000 ක වෙළෙඳ බඩු තොගයක් අත්පිට මුදලට ගැනීම සටහන් කිරීම සඳහා භාවිත කරන මූලාශ්‍ර ලේඛනය වන්නේ

(1) ලදුපත ය.
(2) ගෙවීම් වවුචරය ය.
(3) ගැනුම් ඉන්වොයිසිය ය.
(4) ජ'නල් වවුචරය ය.

**21.** ව්‍යාපාරයක් විසින් පිළියෙල කරනු ලබන මුදල් පොතක දැකිය **නොහැක්කේ** කුමක් ද?

(1) සගල පිටු අංක
(2) ගෙවීම් වවුචර් අංක
(3) ලදුපත් අංක
(4) ඉන්වොයිස් අංක

**22.** ලී බඩු වෙළෙඳ ව්‍යාපාරයක ගැනුම් ජ'නලයේ සටහන් කරනු ලබන ගනුදෙනුව කුමක් ද?

(1) රු. 50 000 ක පුටු අත්පිට මුදලට ගැනීම
(2) රු. 60 000 ක මේස රුවන්ගෙන් ණයට ගැනීම
(3) රු. 75 000 ක ලී අල්මාරියක් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා ණයට ගැනීම
(4) රු. 80 000 ක ඇඳක් අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් ගෙනයාම

**23.** ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණයෙහි වත්කම් හා වගකීම් යන දෙකෙහිම වටිනාකම අඩු කරනු ලබන ගනුදෙනුව වන්නේ

(1) ණයගැතියකුගෙන් රු. 8 000 ක් ලැබීම ය.
(2) රු. 30 000 ක බඩු තොගයක් ණයට ගැනීම ය.
(3) රු. 10 000 ක් ණයහිමියකුට ගෙවීම ය.
(4) රු. 4 000 ක බැංකු ණය පොලී ගෙවීම ය.

**24.** ව්‍යාපාරයක, කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා රු. 130 000 ක පරිගණකයක් අත්පිට මුදලට ගැනීම බලපාන්නේ

(1) වත්කම්වලට පමණි.
(2) වත්කම් හා වගකීම්වලට ය.
(3) වත්කම් හා වියදම්වලට ය.
(4) වත්කම්, හිමිකම් හා වගකීම්වලට ය.

25. සඳුන් රු. 25 000 ක බඩු තොගයක් රු. 30 000 කට ණයට විකිණීම නිසා ඔහුගේ ව්‍යාපාරයේ

(1) වත්කම් හා හිමිකම රු. 5 000 කින් පමණක් අඩු වේ.
(2) වත්කම් හා හිමිකම රු. 5 000 කින් පමණක් වැඩි වේ.
(3) වත්කම් හා වගකීම් රු. 30 000 කින් පමණක් අඩු වේ.
(4) වත්කම් හා හිමිකම රු. 30 000 කින් පමණක් වැඩි වේ.

26. චාමර රු. 10 000 ක බඩු තොගයක් සහන්ගෙන් අත්පිට මුදලට ගැනීමේදී 5% ක වෙළෙඳ වට්ටමක් ඔහුට ලැබුණි. මෙම ගනුදෙනුවට අදාළ නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

(1) ගැනුම් ගිණුම හර රු. 10 000
සහන්ගේ ගිණුම බැර රු. 9 500
ලද වට්ටම් ගිණුම බැර රු. 500

(2) ගැනුම් ගිණුම හර රු. 10 000
මුදල් ගිණුම බැර රු. 9 500
ලද වට්ටම් ගිණුම බැර රු. 500

(3) ගැනුම් ගිණුම හර රු. 9 500
සහන්ගේ ගිණුම බැර රු. 9 500

(4) ගැනුම් ගිණුම හර රු. 9 500
මුදල් ගිණුම බැර රු. 9 500

27. රවිගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනට සුළු මුදල් පොතේ විශ්ලේෂණ තීරුවල එකතුව රු. 9 500 ක් වූ අතර එදිනට එහි ශේෂය රු. 500 ක් විය. 2026.01.01 දින සිට සුළු මුදල් අග්‍රිමය රු. 2 000 කින් වැඩි කිරීමට රවි තීරණය කළේ ය. 2026.01.01 දින සුළු මුදල් ප්‍රතිපූරණය කිරීම සඳහා ලබා දුන් මුදල වන්නේ

(1) රු. 2 500 කි. (2) රු. 10 000 කි. (3) රු. 11 500 කි. (4) රු. 12 000 කි.

28. බැංකු ප්‍රකාශනය ලැබීමෙන් පසු ව්‍යාපාරයක බැංකු ගිණුම සංශෝධනය කිරීමේදී එම ගිණුමේ හර පැත්තේ සටහන් කරනු ලබන අයිතමයක් වන්නේ

(1) බැංකු ගාස්තු ය.
(2) බැංකු ණය වාරික ය.
(3) ණයගැති සෘජු ප්‍රේෂණ ය.
(4) නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් ය.

29. බැංකුව විසින් එවනු ලබන බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය වැඩි වීමට හේතුවක් වන්නේ

(1) බැංකුවට සෘජුවම ලැබුණු ප්‍රේෂණ ය.
(2) ස්ථාවර නියෝග මත බැංකුව විසින් ගෙවූ රක්ෂණ ගාස්තු ය.
(3) බැංකුවට සෘජුව ලැබී ඇති ආයෝජන ආදායම ය.
(4) නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් ය.

30. ව්‍යාපාරයක ගිණුම්කරණයේදී සිදු වූ වැරදිවලින් ශේෂ පිරික්සුමෙහි සමානත්වයට බලපෑමක් **නොවන** වරදක් වන්නේ

(1) රු. 5 000 ක ගමන් වියදම් එම ගිණුමේ දෙවරක් සටහන් වීම ය.
(2) සමන්ට ගෙවූ රු. 10 000 ක්, මුදල් පොතේ පමණක් සටහන් වීම ය.
(3) රු. 75 000 කට මිල දී ගත් බඩු තොගයක් ගැනුම් ගිණුමේ රු. 57 000 ක් ලෙස සටහන් වීම ය.
(4) අමිත්ගෙන් ලැබුණු රු. 30 000 ක් අමල්ගේ ගිණුමේ බැර පැත්තේ සටහන් කිරීම ය.

31. ණයගැති සමන්ගෙන් ලැබුණු රු. 10 000 ක් සමන්ගේ ගිණුමට හර කිරීමේ වරද නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන තෝරන්න.

(1) සමන්ගේ ගිණුම හර රු. 10 000
අවිනිශ්චිත ගිණුම රු. 10 000

(2) අවිනිශ්චිත ගිණුම හර රු. 10 000
සමන්ගේ ගිණුම රු. 10 000

(3) සමන්ගේ ගිණුම හර රු. 20 000
අවිනිශ්චිත ගිණුම රු. 20 000

(4) අවිනිශ්චිත ගිණුම හර රු. 20 000
සමන්ගේ ගිණුම රු. 20 000

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- පහත තොරතුරු භාවිතයෙන් අංක **32** සහ **33** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ළමා ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක ඇඳුම් 1000 ක් නිෂ්පාදනය කිරීම සඳහා වූ වියදම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| රෙදි හා නූල් සඳහා ........................ | 100 000 |
| ඇඳුම් මසන්නාගේ වැටුප ........................ | 60 000 |
| විදුලි වියදම ........................ | 25 000 |
| ගොඩනැගිලි කුලී ........................ | 15 000 |
| මුරකරුගේ වැටුප ........................ | 40 000 |
| යන්ත්‍ර ක්ෂය ........................ | 10 000 |

**32.** මෙම ව්‍යාපාරයේ නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය

(1) රු. 50 000 කි. (2) රු. 90 000 කි. (3) රු. 160 000 කි. (4) රු. 250 000 කි.

**33.** මෙම ව්‍යාපාරයේ නිපදවන ළමා ඇඳුමක නිෂ්පාදන පිරිවැය

(1) රු. 50 කි. (2) රු. 90 කි. (3) රු. 160 කි. (4) රු. 250 කි.

**34.** සුහද ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 80 කි. එක් සාමාජිකයකුගේ මාසික සාමාජික මුදල රු. 100 කි. 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සාමාජිකයින් 50 ක් පමණක් වාර්ෂික සාමාජික මුදල් ගෙවා තිබුණි. අනෙකුත් සාමාජිකයින් කිසිදු මුදලක් ගෙවා නැත.

2025.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ලැබීම් හා ගෙවීම් ගිණුමේ සටහන් කරනු ලබන සාමාජික මුදල වන්නේ

(1) රු. 5 000 කි. (2) රු. 8 000 කි. (3) රු. 60 000 කි. (4) රු. 96 000 කි.

- පහත සඳහන් තොරතුරු භාවිත කරමින් අංක **35** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

විනෝත්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනටශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ගැනුම් ........................ | 2 000 000 | |
| විකුණුම් ........................ | | 3 400 000 |
| 2025.01.01 දිනට තොගය ........................ | 100 000 | |
| 2025.01.01 දිනට ගොඩනැගිලි පිරිවැය ........................ | 2 500 000 | |
| 2025.01.01 දිනට මෝටර් රථ පිරිවැය ........................ | 1 000 000 | |
| 10% බැංකු ණය ........................ | | 500 000 |
| ණයගැතියෝ ........................ | 100 000 | |
| ණයහිමියෝ ........................ | | 80 000 |
| ප්‍රචාරණ වියදම් ........................ | 80 000 | |
| සේවක වැටුප් ........................ | 100 000 | |
| බැංකු ණය පොලී ........................ | 10 000 | |
| විදුලි වියදම් ........................ | 60 000 | |
| ප්‍රාග්ධනය (2025.01.01 දිනට) ........................ | | 2 000 000 |
| ලද වට්ටම් ........................ | | 20 000 |
| මුදල් ........................ | 50 000 | |
| | 6 000 000 | 6 000 000 |

**අතිරේක තොරතුරු :**

1. 2025.12.31 දිනට තොගය රු. 900 000
2. 2025.12.31 දිනට ගෙවිය යුතු විදුලිය රු. 20 000
3. ගොඩනැගිලි සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 8% බැගින් ක්ෂය කළ යුතු ය.

35. රිෂාන්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය

(1) රු. 1 200 000 කි. (2) රු. 1 300 000 කි. (3) රු. 1 400 000 කි. (4) රු. 2 200 000 කි.

36. රිෂාන්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් ආයතන හා පරිපාලන වියදම්වල එකතුව

(1) රු. 320 000 කි. (2) රු. 360 000 කි. (3) රු. 380 000 කි. (4) රු. 460 000 කි.

37. රිෂාන්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කරන මූල්‍ය වියදම්වල එකතුව

(1) රු. 450 000 කි. (2) රු. 490 000 කි. (3) රු. 510 000 කි. (4) රු. 560 000 කි.

38. රිෂාන්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය

(1) රු. 930 000 කි. (2) රු. 1 690 000 කි. (3) රු. 1 710 000 කි. (4) රු. 1 720 000 කි.

39. රිෂාන්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනට ජංගම නොවන වත්කම්වල ධාරණ අගය

(1) රු. 3 500 000 කි. (2) රු. 3 300 000 කි. (3) රු. 3 250 000 කි. (4) රු. 2 300 000 කි.

40. රිෂාන්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනට හිමිකම

(1) රු. 3 720 000 කි. (2) රු. 3 710 000 කි. (3) රු. 3 690 000 කි. (4) රු. 2 930 000 කි.

* *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

| | |
|---|---|
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | I, II |
| வணிகக் கல்வியும் கணக்கீடும் | I, II |
| Business and Accounting Studies | I, II |

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**උපදෙස්:**

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

※ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

**1.** පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ආයතනයක තාක්ෂණික නිලධාරියකු ලෙස සේවය කළ තිළිණ පෙරේරා 2026.01.01 දින තමා සතු රු. 700 000 ක මුදල ද රු. 216 000 ක් වූ පරිගණකය හා රු. 24 000 ක ආවුද හා උපකරණ ද යොදවා 'තිළිණ ව්‍යාපාරය' නමින් තාක්ෂණික උපකරණ අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. එදින ම ඔහු 6% ක වාර්ෂික පොලියට රු. 200 000 ක බැංකු ණයක් ලබාගත්තේ ය. වෙනත් කිසිදු ගනුදෙනුවක් එදින සිදු වූයේ නැත.

තිළිණ පෙරේරා තොරතුරු තාක්ෂණය පිළිබඳ පාඨමාලාවක් නිම කළ වරින් හා කිසිදු පුහුණුවක් හෝ සේවා පළපුරුද්දක් නොමැති කවිදු පිළිවෙළින් රු. 50 000 ක හා රු. 20 000 ක මාසික වැටුපකට ව්‍යාපාරයේ සේවකයින් ලෙස බඳවා ගත්තේ ය.

තිළිණ ව්‍යාපාරයේ 2026 ජනවාරි මාසයේ දී සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| තාක්ෂණික උපකරණ අලුත්වැඩියාවෙන් ලැබීම් | 600 000 |
| මාසය තුළ අලුත්වැඩියා කිරීම්වලට අදාළ වියදම් | 250 000 |
| මාසික විදුලි ගාස්තු ගෙවීම | 5 000 |
| මාසික රක්ෂණ ගාස්තු ගෙවීම | 2 000 |
| මාසික ගෙවල් කුලී ගෙවීම | 12 000 |
| සේවක වැටුප් ගෙවීම - වරින් | 40 000 |
| - කවිදු | 20 000 |
| 2026.01.31 දින සහන ලී බඩු වෙළෙඳසැලෙන් ලී බඩු ණයට ගැනීම | 200 000 |

තිළිණ ව්‍යාපාරය විසින් සමාජ මාධ්‍යය භාවිත කර, ව්‍යාපාරය ප්‍රචාරණය කරන අතර මාර්ගගත ක්‍රමයට (online) ඇණවුම් භාරගෙන, තම ව්‍යාපාර ස්ථානයේ දී මෙන් ම නිවෙස්වලට ද ගොස් තාක්ෂණ උපකරණ අලුත්වැඩියා කිරීම් කරනු ලැබේ.

තිළිණ පෙරේරා නිතරම ව්‍යාපාරයේ සේවකයින්ගේ වැඩකටයුතු සොයා බලා ඔවුන්ට අවශ්‍ය උපදෙස් ලබාදෙයි. ඔහු සියලු ම තාක්ෂණික උපකරණ අලුත්වැඩියා කිරීම් ගුණාත්මක බවින් යුතුව, සාධාරණ මිලට නියමිත වේලාවට සිදු කිරීමට අපේක්ෂා කරයි.

**අමතර තොරතුරු:**

- පරිගණකයෙහි ඵලදායී ජීව කාලය වසර 6 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.
- ආවුද හා උපකරණ වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු ය.

(i) (අ) 'තිළිණ ව්‍යාපාරය' නිෂ්පාදිතයේ ස්වභාවය අනුව අයත් වන්නේ කුමන වර්ගයේ ව්‍යාපාරයකට ද?
(ආ) තිළිණ ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කළ යුතු ද? එයට හේතුව ලියන්න.

(ii) (අ) තිළිණ ව්‍යාපාරයේ ශක්තියක් හා දුර්වලතාවක් වෙන වෙන ම ලියන්න.
(ආ) 'තිළිණ ව්‍යාපාරය' ලබාගෙන ඇති උපකාරක සේවා **දෙකක්** නම් කර, ඒවා සඳහා සිද්ධිය ඇසුරෙන් නිදසුන බැගින් ලියන්න.

/අවසාන පිටුව බලන්න.

(iii) (අ) 'තිළිණ ව්‍යාපාරය' හා සම්බන්ධ පහත සඳහන් එක් එක් නිෂ්පාදන සාධකය සඳහා නිදසුන බැගින් ලියන්න.

1. ශ්‍රමය
2. ප්‍රාග්ධනය

(ආ) ඉහත සිද්ධියේ ඇතුළත් පහත එක් එක් ව්‍යාපාර ක්‍රියාකාරකම අයත් වන කළමනාකරණ කාර්ය සඳහන් කරන්න.

1. ව්‍යාපාරයට චරිත් සහ කවිඳු සේවකයින් ලෙස බඳවා ගැනීම
2. තිළිණ ව්‍යාපාර කටයුතු පිළිබඳ නිතර සොයා බැලීම

(iv) (අ) තිළිණ ව්‍යාපාරයේ අලෙවිකරණයට අයත් වන කටයුතු **දෙකක්** ලියන්න.

(ආ) සිද්ධියේ ඇතුළත් ආයෝජන මාර්ගයක් නම් කර, එයින් ලැබෙන ප්‍රතිලාභයක් සඳහන් කරන්න.

(v) තිළිණ ව්‍යාපාරයේ 2026.01.01 දිනට ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිතව ලියා දක්වන්න.

(vi) (අ) තිළිණ ව්‍යාපාරය භාවිත කළ මූලාශ්‍ර ලේඛන **දෙකක්** සඳහන් කරන්න.

(ආ) ඉහත (vi)(අ) හි නම් කළ එක් එක් මූලාශ්‍ර ලේඛනයට අදාළ සිද්ධියේ ඇතුළත් ගනුදෙනුව බැගින් ලියන්න.

(vii) තිළිණ ව්‍යාපාරයේ 2026.01.31 දිනට මුදල් ශේෂය ගණනය කරන්න.

(viii) තිළිණ ව්‍යාපාරයේ 2026.01.31 දිනෙන් අවසන් මාසය සඳහා පරිගණක ක්ෂය සහ ආවුද හා උපකරණ ක්ෂය වෙන වෙන ම ගණනය කරන්න.

(ix) තිළිණ ව්‍යාපාරයේ 2026.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන වියදම් වටිනාකම් සහිතව ලියන්න.

(x) තිළිණ ව්‍යාපාරයේ 2026.01.31 දිනට පහත අයිතමවල මුළු වටිනාකම සඳහන් කරන්න.

(අ) මුළු වත්කම්

(ආ) ජංගම වගකීම් (ලකුණු 02 × 10 = 20 යි)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

2. (i) ඒකල ස්වාමි ව්‍යාපාරයක් හා හවුල් ව්‍යාපාරයක් අතර ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) අවශ්‍යතා ඉටුකර ගන්නා විවිධ ආකාර 'වුවමනා' වේ.

(ආ) මූල්‍ය ආයතන ව්‍යාපාරවලට ඇල්මක් දක්වන්නේ දෙන ලද ණය අය කර ගැනීමට ය.

(ඉ) හවුල් ව්‍යාපාරවලට නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පෙනී සිටිය හැකි ය.

(ඊ) රටක රජය විසින් ගනු ලබන යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්ති නෛතික පරිසරයට අයත් වේ.

(ලකුණු 02 යි)

(iii) කොටුවැව මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් සංවිධානය කරන ලද පාසල් හැර ගිය සිසුන් සඳහා ස්වයං රැකියා මාවතකට පිවිසීමට අවශ්‍ය පුහුණු වැඩමුළුවක් වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පවත්වන ලදී.

(අ) මෙම ප්‍රකාශයේ ඇතුළත් කොටුවැව මහා විද්‍යාලයේ අභ්‍යන්තර පරිසර සාධකයක් සහ බාහිර පරිසර සාධකයක් පිළිවෙළින් ලියන්න.

(ආ) මෙම ප්‍රකාශයේ ඇතුළත් පහත සඳහන් එක් එක් රාජ්‍ය අංශයේ ආයතන අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න.

1. කොටුවැව මහා විද්‍යාලය
2. වෘත්තීය පුහුණු අධිකාරිය (ලකුණු 02 යි)

(iv) වෙළෙඳාම සම්බන්ධ සිදුවීම් දෙකක් පහත දැක්වේ.

**A** – දසුන්, සුමති හාඩ්වෙයාර් වෙතින් තම නිවස අලුත්වැඩියාව සඳහා සිමෙන්ති කොට්ට 10 ක් මිල දී ගැනීම

**B** – ජයසිංහ වෙළෙන්දෝ විසින් 'තෙළුම් කොළේ' ආපන ශාලාවට කෑම් පැකට් සකස් කර විකිණීම සඳහා රු. 15 000 ක සහල් තොගයක් විකිණීම

(අ) ඉහත සඳහන් සිදුවීම් දෙකෙහි ඇතුළත් සිල්ලර වෙළෙන්දකු හා තොග වෙළෙන්දකු පිළිවෙළින් නම් කරන්න.

(ආ) 'තෙළුම් කොළේ' ආපන ශාලාවට ඇල්මක් දක්වන පාර්ශ්ව **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 යි)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

3. (i) හර කාඩ්පතක (Debit card) සහ ණය කාඩ්පතක (Credit card) සමානකම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) දේපළ රක්ෂණයට හානිපූර්ණ මූලධර්මය අදාළ වේ.

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් චෙක්පොත් නිකුත් කරනු ලැබේ.

(ඉ) ආයතනයක් තුළ විවිධ මාධ්‍යය භාවිත කරමින් පණිවුඩ හා තොරතුරු හුවමාරු කර ගැනීම අභ්‍යන්තර සන්නිවේදනයයි.

(ඊ) ප්‍රවාහනය සඳහා භාවිත කරන මංමාවත් ප්‍රවාහන මූලිකාංගයක් වන මාධ්‍යයට අයත් වේ. (ලකුණු 02 යි)

(iii) 2026.01.30 දින අසිත දිවාකර රු. 50 000 ක බඩු තොගයක් නිමල් පෙරේරාගෙන් මිල දී ගත්තේ ය. මේ සඳහා කළමනාකරණ සහකරුවකු වූ කමල් ප්‍රනාන්දු විසින් මහරගම ලංකා බැංකු, රේඛිත චෙක්පතක් ලියා නිමල් පෙරේරාට දෙන ලදී. ඉහත තොරතුරු ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) මෙම චෙක්පතෙහි අණකරු හා ආදායකයා පිළිවෙළින් නම් කරන්න.

(ආ) මෙම චෙක්පතට බැංකු කවුන්ටරයෙන් මුදල් ලබාගත හැකි ද? ඔබේ පිළිතුරට හේතුව ලියන්න. (ලකුණු 02 යි)

(iv) අධිවේගී මාර්ගයේ තම මෝටර් රථයෙන් ගමන් කරමින් සිටියදී කුමාර හදිසි අනතුරකට ලක් වී රු. 5 000 000 කට රක්ෂණය කර තිබූ එම මෝටර් රථයට හානි සිදු විය. මෙම අවස්ථාවේ දී කුමාරගේ මෝටර් රථය රක්ෂණය කරනු ලැබූ රක්ෂණ සමාගමේ නියෝජිතයෙක් අහඹු ලෙස එම ස්ථානයට පැමිණ, අනතුර පිළිබඳ විමසා බලා, ඒ සඳහා රු. 3 000 000 ක වන්දියක් ගෙවිමට හැකි බව දන්වා සිටියේ ය.

(අ) මෙම සිද්ධියේ ඇතුළත් ප්‍රවාහන මාධ්‍යය හා සන්නිවේදන මාධ්‍යය පිළිවෙළින් නම් කරන්න.

(ආ) රක්ෂණ සමාගම රු. 3 000 000 ක් පමණක් වන්දිය ලෙස ගෙවිය හැකි බව ප්‍රකාශ කිරීමට හේතුව හා එයට අදාළ රක්ෂණ මූලධර්මය සඳහන් කරන්න. (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

4. (i) කළමනාකරණයේ දී 'පාලනය' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) සැම ආයතනයක් තුළ ම කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ.

(ආ) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් ආයතනයට පාලනය කළ හැකි ය.

(ඉ) ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරයි.

(ඊ) කොළඹ කොටස් වෙළෙඳපොළේ සාමාන්‍ය කොටස් මිල දී ගැනීමට වඩා බැංකුවක ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම අවදානම් වැඩි ආයෝජන මාර්ගයකි. (ලකුණු 02 යි)

(iii) ලී බඩු නිෂ්පාදනය කර අලෙවි කරන ව්‍යාපාරයක කාර්ය කිහිපයක් පහත දැක්වේ.

**A** – රු. 50 000 කට වඩා එකවර ලී බඩු මිල දී ගැනීමේ දී 20% ක වට්ටමක් ලබා දීම

**B** – නවතම මෝස්තර අනුව ලී බඩු සෑදීම

**C** – ව්‍යාපාරයේ නම සඳහන් කළ පුටු 20 ක් රෝහලකට පරිත්‍යාග කිරීම

**D** – ව්‍යාපාරය ලී බඩු විකිණීම සඳහා වෙළෙඳසැල් දෙකක් පවත්වාගෙන යාම

ඉහත එක් එක් කාර්යයට අදාළ අලෙවි මිශ්‍රයේ විචල්‍යය පිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iv) ස්වයං රැකියාවක නියුතු සමාධි තමාගේ රු. 500 000 ක මුදල් ආයෝජනය කර ඇත්තේ මෙසේ ය.

**A** – කොටසක් රු. 100 බැගින් සාමාන්‍ය කොටස් 2 000 ක් සීමිත අග්‍රා (පී.එල්.සී.) සමාගමෙන් මිල දී ගැනීම

**B** – වසරකින් කල්පිරෙන රු. 300 000 ක භාණ්ඩාගාර බිල්පත් මහජන බැංකුවෙන් මිල දී ගැනීම

(අ) ඉහත එක් එක් ආයෝජන මාර්ගයෙන් සමාධිට ලැබෙන ප්‍රතිලාභය බැගින් වෙන් වෙන්ව පිළිවෙළින් සඳහන් කරන්න.

(ආ) ඉහත ආයෝජන මාර්ග දෙකෙන් අවදානම අඩු ම ආයෝජන මාර්ගය නම් කර, එයට හේතුව ලියන්න. (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

5. (i) ගිණුම්කරණයේ දී මූලාශ්‍ර ලේඛන භාවිත කිරීමෙන් ව්‍යාපාරයකට ලබා ගත හැකි ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) ව්‍යාපාරයක මුදල් පොතේ හර පැත්තේ සටහන් කරනු ලබන ගනුදෙනු **හතරක්** වටිනාකම් සහිතව ලියන්න. (ලකුණු 02 යි)

(iii) මාලන්ගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු දෙකක් ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පහත දැක්වේ.

| ගනුදෙනු අංකය | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| | බඩු තොග (රු.) | මුදල් (රු.) | (රු.) | ණයහිමියෝ (රු.) | බැංකු ණය (රු.) |
| (1) | + 25 000 | | | + 25 000 | |
| (2) | | - 20 000 | | | - 20 000 |
| (3) | | | | | |
| (4) | | | | | |

**අවශ්‍ය වන්නේ :**

(අ) ඉහත ගනුදෙනු අංක (1) හා (2) වටිනාකම් සහිතව ලිවීම

(ආ) පහත සඳහන් ගනුදෙනු අංක (3) හා (4), මාලන්ගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය ඉහත ආකෘතියට අනුව දැක්වීම

(3) - රු. 30 000 ක භාණ්ඩ රු. 35 000 කට අත්පිට මුදලට විකිණීම

(4) - රු. 10 000 ක ව්‍යාපාරයේ රක්ෂණ ගාස්තු ගෙවීම (ලකුණු 04 යි)

(iv) ජීවන්ගේ ව්‍යාපාරයේ 2025 දෙසැම්බර් මාසය තුළ සිදු කරන ලද ගැනුම් පහත දැක්වේ.

2025.12.02 - ඉන්වොයිසි අංක 118 යටතේ නාමල්ගෙන් ගත් භාණ්ඩ රු. 75 000 කි.
2025.12.10 - ඉන්වොයිසි අංක 120 යටතේ සහන්ගෙන් ගත් භාණ්ඩ රු. 50 000 කි.
2025.12.15 - ගෙවීම් වවුචර අංක 113 යටතේ සුහද වෙළෙඳසැලෙන් අත්පිට මුදලට ගත් භාණ්ඩ රු. 60 000 කි.
2025.12.21 - ඉන්වොයිසි අංක 202 යටතේ කමල්ගෙන් ගත් භාණ්ඩ රු. 30 000 කි. වෙළඳ වට්ටම 10% කි.
2025.12.28 - ගෙවීම් වවුචර අංක 115 යටතේ සුපර් හවුස් වෙතින් මිල දී ගත් භාණ්ඩ රු. 20 000 කි.

**අවශ්‍ය වන්නේ :**

(අ) 2025 දෙසැම්බර් මාසය සඳහා ජීවන්ගේ ව්‍යාපාරයේ ගැනුම් ජ'නලය පිළියෙල කිරීම

(ආ) ජීවන්ගේ ව්‍යාපාරයේ ගැනුම් ගිණුම පිළියෙල කර, 2025.12.31 දිනට මුළු ගැනුම්වල වටිනාකම දැක්වීම (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

6. (i) බැංකුව චෙක්පත් අගරු කරන අවස්ථා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) සඳුන්ගේ ව්‍යාපාරයේ මාසයක් තුළ අල චොෆි පැකට් 1000 ක් නිෂ්පාදනය කිරීමට අදාළ වියදම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| අර්තාපල් .................................... | 29 000 |
| සීනි .................................... | 6 000 |
| විදුලි වියදම් .................................... | 5 000 |
| අල චොෆි සාදන්නාගේ වැටුප .................................... | 20 000 |
| වෙනත් වක්‍ර වියදම් .................................... | 8 500 |

**අතිරේක තොරතුරු :**

- අල චොෆි සෑදීමේ උපකරණ පිරිවැය රු. 150 000 කි.
- අල චොෆි සෑදීමේ උපකරණ පිරිවැය මත වාර්ෂිකව 12% බැගින් ක්ෂය කළ යුතු ය.
- ලාභාන්තිකය පිරිවැය මත 10% කි.

**අවශ්‍ය වන්නේ :**

(අ) අල චොෆි නිෂ්පාදනයේ ප්‍රාථමික පිරිවැය

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(iii) ක්‍රිෂ්ණාගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම සමාන නොවූ අතර පසුව පහත සඳහන් ගිණුම්කරණ වැරදි සොයා ගන්නා ලදී.

1. අත්පිට විකුණුම් රු. 50 000 ක් විකුණුම් ගිණුමේ රු. 5 000 ක් ලෙස සටහන් වීම
2. යන්ත්‍ර අලුත්වැඩියාවට ගෙවූ රු. 10 000 ක් යන්ත්‍ර ගිණුමට හර කිරීම
3. ගෙවූ පොලී රු. 12 000 ලද පොලී ගිණුමේ බැර පැත්තේ සටහන් වීම

**අවශ්‍ය වන්නේ :**

(අ) ඉහත වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන්

(ආ) 2025.12.31 දිනට ශේෂ පිරික්සුමේ තිබූ වෙනස දක්වමින් අවිනිශ්චිත ගිණුම (ලකුණු 04 යි)

(iv) නාරදගේ ව්‍යාපාරයේ 2026 ජනවාරි මාසයේ බැංකු ගිණුම හා බැංකු ප්‍රකාශනය පහත දැක්වේ.

බැංකු ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම (රු.) | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 2026.01.01 | ශේෂය ඉ/ගෙ | | 10 000 | 2026.01.02 | විදුලිය (452200) | | 3 000 |
| 2026.01.03 | තැන්පතු-මුදල් | | 5 000 | 2026.01.04 | සමීර (452201) | | 15 000 |
| 2026.01.06 | තැන්පතු-චෙක් (204) | | 18 000 | 2026.01.08 | වැටුප් (452202) | | 8 000 |
| 2026.01.09 | තැන්පතු-චෙක් (500) | | 9 000 | 2026.01.30 | කුමාර (452203) | | 7 000 |
| | | | | 2026.01.31 | ශේෂය ප/ගෙ | | 9 000 |
| | | | 42 000 | | | | 42 000 |
| 2026.02.01 | ශේෂය ඉ/ගෙ | | 9 000 | | | | |

**2026 ජනවාරි මාසයේ බැංකු ප්‍රකාශනය**

| දිනය | විස්තරය | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 2026.01.01 | ශේෂය | - | - | 10 000 |
| 2026.01.03 | චෙක් - 452200 | 3 000 | - | 7 000 |
| 2026.01.03 | තැන්පතු - මුදල් | - | 5 000 | 12 000 |
| 2026.01.06 | චෙක් තැන්පතු - 204 | - | 18 000 | 30 000 |
| 2026.01.08 | චෙක් - 452202 | 8 000 | - | 22 000 |
| 2026.01.20 | චෙක්පොත් ගාස්තු | 1 000 | - | 21 000 |
| 2026.01.30 | චෙක් - 452203 | 7 000 | - | 14 000 |
| 2026.01.30 | ණයගැතියකුගේ සෘජු ප්‍රේෂණ | - | 12 000 | 26 000 |

**අවශ්‍ය වන්නේ :**

(අ) 2026.01.31 දිනට නාරදගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

(ආ) 2026.01.31 දිනට නාරදගේ ව්‍යාපාරයේ බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම

(ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

7. (i) 'ගෙවිය යුතු වියදම්' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ශක්ති සුභසාධක සංගමයේ භාණ්ඩාගාරික විසින් ගණනය කරන ලද 2025.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ලැබීම් හා ගෙවීම් සාරාංශය පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| සාමාජික මුදල් ලැබීම් ........................................ | 52 000 |
| සඟරා මුද්‍රණය සඳහා ........................................ | 18 000 |
| සඟරා විකුණුම්වලින් ........................................ | 30 000 |

**අතිරේක තොරතුරු:**

- ලැබිය යුතු සාමාජික මුදල් රු. 3 000 කි.

**අවශ්‍ය වන්නේ :**

2025.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම (ආදායම් ප්‍රකාශනය) පිළියෙල කිරීම

(ලකුණු 02 යි)

(iii) සුගාන්ගේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2025.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 400 000 |
| මුදල් | 20 000 | |
| 8% බැංකු ණය | | 100 000 |
| ණයගැතියෝ | 22 000 | |
| ණයහිමියෝ | | 25 000 |
| බොල් ණය | 1 200 | |
| මෝටර් රථ (පිරිවැයට) | 250 000 | |
| ඉඩම් (පිරිවැයට) | 400 000 | |
| බැංකු ණය පොලී | 3 000 | |
| පරිපාලන වැටුප් | 15 000 | |
| විදුලි ගාස්තු | 8 500 | |
| තොගය (2025.01.01 දිනට) | 4 000 | |
| ගැනුම් | 140 000 | |
| විකුණුම් | | 350 000 |
| ගෙනඒමේ කුලී | 8 000 | |
| ලද ගෙවල් කුලී | | 5 000 |
| ප්‍රචාරණ වියදම් | 4 500 | |
| වෙනත් වියදම් | 2 000 | |
| රක්ෂණ ගාස්තු | 1 800 | |
| | 880 000 | 880 000 |

**අතිරේක තොරතුරු:**

- 2025.12.31 දිනට ඉතිරි තොගය රු. 40 000 කි.
- මෝටර් රථ සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය කළ යුතු ය.
- 2025.12.31 දිනට ගෙවිය යුතු රක්ෂණ වාරිකය රු. 1 200 කි.

**අවශ්‍ය වන්නේ :**

(අ) 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සුගාන්ගේ ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04 යි)

(ආ) 2025.12.31 දිනට සුගාන්ගේ ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න